**වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2018**

---

වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹී 2009 ජුනි 29 දිනැති අංක 2477 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය, 2009 ජුනි 29 දිනැති ප්‍රදාන අංක 0129/0130 එස්ආර්අයි (එස්එෆ්) සහ 2013 පෙබරවාරි 13 දිනැති 2977- එස්ආර්අයි (එස්එෆ්) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාතේ මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සහ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය ඇතුළත් ශ්‍රී ලංකාවේ උතුරු හා වයඹ වියළි කලාපීය නාගරික ජනගහනයේ භෞතික සුභසාධනය වැඩි දියුණු කිරීමයි. ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 19,165 කට සමාන එජඩො මිලියන 163.33 ක් වූ අතර ඉන් රු. මිලියන 11,809 කට සමාන එජඩො මිලියන 99.78 ක් ණයක් ලෙස සහ රු.මිලියන 2,649 කට සමාන එජඩො මිලියන 23.22 ක් ප්‍රදානයක් ලෙස ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ජල මූල්‍යයන හවුල්කරු පහසුකම් සඳහා රු.මිලියන 228 කට සමාන එජඩො මිලියන 2 ක ප්‍රදානයක් ආසියානු සංවර්ධන බැංකුව හරහා සිදු කිරීමට නෙදර්ලන්ත භාර අරමුදල ද (නෙ හා අ) එකඟ වී තිබූ අතර රු. මිලියන 4,479 කට සමාන එජඩො මිලියන 38.33 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 නොවැම්බර් 13 දින ආරම්භ කළ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපාතියේ කාර්යා නිම කිරීමේ දිනය 2018 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| --------------- | ------------- | ---------- | -------------- | --------------- |
| (අ) 2018 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද එකතු කිරීමේ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | 135.13 | රජයේ දායකත්වය අව ප්‍රමාණවේ. | එකතු කිරීමේ අගය මත බදු රජයේ අරමුදල්වලට එරෙහිව හිලව් කල හැක. | ශ්‍රී ලංකා රජයෙන් ලත් මුළු දායකය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද පොළී හා බැඳීම් ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 404.10 | එම | මෙය මුදල් අමාත්‍යංශයේ වියදමක් ලෙස සැලකෙන නිසා ගිණුම්වලට ගෙන නැත. | සමාලෝචිත වර්ෂය අවසානයේ උපයෝජනය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

උතුරු හා වයඹ පළාත්වල නාගරික ජනතාවගේ භෞතික සුභ සාධනය වැඩි දියුණු කිරීම පිණිස ව්‍යාපෘතිය විසින් ජල සම්පාදන හා සෞඛ්‍ය ආරක්ෂණ කටයුතු කිහිපයක්, ජල හා සෞඛ්‍ය ආරක්ෂණ යටිතල පහසුකම් වර්ධනය කිරීම සහ උතුරු හා වයඹ ප්‍රදේශවල ජල අංශයේ ආයතන ශක්තිමත් කිරීම යන සංරචක යටතේ ක්‍රියාත්මක කර තිබුණි.

| කාර්යය | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | විගණිත ගැටලුව | බලපෑම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය | | | |
| සංරචකය 01 :- ජල හා සෞඛ්‍ය ආරක්ෂණ යටිතල පහසුකම් වර්ධනය | | | | | |
| ප්‍රධාන ජල සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ පද්ධතිය සඳහා පයිප්ප,නල හා සවි කිරිම් සැපයීම හා එළීම | | | | | |
| • වවුනියාවේ ප්‍රධාන ජල සම්ප්‍රේෂණ මාර්ගවල නල එළීම | කි.මී.24 | කි.මී.19 | 2016 වර්ෂයේදී තත්ත්වයෙන් බාල පයිප්ප සපයා ඇති බව නිරීක්ෂණය විය. | දෝෂ සහිත පයිප්ප ප්‍රතිස්ථාපනය වෙනුවෙන් කාලය දීර්ඝ කිරීමට සිදුවිය හැක. | තත්ත්ව සහතික යාන්ත්‍රණය වැඩි දියුණු කල යුතුය |
| • මන්නාරමේ පේසාලේ සිට එලුතූර් දක්වා සම්ප්‍රේෂණ නල එළීම් | කි.මී.16 | නැත | කොන්ත්‍රාත්තුව 2018 සැප්තැම්බර් 18 දින ප්‍රදානය කල අතර 2018 දෙසැම්බර් වන විට නිම කිරීමට අපේක්ෂිතය. | නිම කිරීම් ප්‍රමාදවීම් මත අදාල පිරිවැය ඉහළ යනු ඇත. | කාර්යය නිම කිරීම සඳහා කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. |
| • පුත්තලම සිට හලාවත දක්වා බෙදා හැරීම් නල එළීම් | කි.මී 48.9 | නැත | එම | කාර්ය නිම කිරීමේ ප්‍රමාදය ව්‍යාපෘති කාලය ද ඉක්මවා යා හැක. | එම |
| සංරචක 02 :- උතුර හා වයඹ ප්‍රදේශවල ජල ආශ්‍රිත ආයතන ශක්තිමත් කිරීම | | | | | |
| සූර්ය පැනල සහ සී.සී.ටී.වී පද්ධති සැපයීම හා ප්‍රතිස්ථාපනය | ඒකක 02 | නැත | එම | එම | එම |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) අප ජල පිරිපහදු කිරීමේ පිරියතතේ සිට වවුනියාවේ පේරුආරු ජලාශය දක්වා අප ජල අපවහන පයිප්ප සැපයීමේ හා එළීමේ කොන්ත්‍රාත්තුව 2017 අප්‍රේල් ප්‍රදානය කර තිබූ අතර 2018 ජනවාරි 18 නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2018 නොවැම්බර් 25 දින දක්වා ව්‍යාපෘතියට කාල දිගුවන් දෙකක් ලබා දී තිබුණ ද අදාල කාර්යය 2018 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘති කාලය අවසන් වන විටත් කාර්යයන් අසම්පූර්ණව පැවතීම. | අදාල කොන්ත්‍රාත්තුව යටතේ කාර්යයන් 2019 වන විට නිම කරනු ඇත. කෙසේ වුවද ප්‍රවේශ මාර්ග සම්පූර්ණ කර නොමැත. | ප්‍රමාදයට හේතු විමර්ශනයකර එයට වගකිය යුතු පාර්ශව හඳුනා ගත යුතුය. |
| (ආ) පිරිවැය රු.මිලියන 598.83කට 2013 වර්ෂයේ පිරිනමන ලද ප්‍රධාන ජල සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධතිය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත් කාලය 6 වරක් දිර්ඝ කර තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විටත් අසම්පූර්ණව පැවතුණි. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2018 දෙසැම්බර් 31 දිනෙන් පසුවත් ඉදිකිරීම් කටයුතු කරගෙන ගොස් තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් තත්වයෙන් බාල පයිප්ප සපයා ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ අවසාන අරමුණ ළඟා කර ගත නොහැකි වේ. | කොන්ත්‍රාත්කරුට 2019 මැයි අවසාන වන තුරු කාර්ය කරගෙන යාමට අවසර දී ඇත. | ව්‍යාපෘතියේ කාර්ය ප්‍රමාදවීමට හේතු විමර්ශනය කළ යුතුය. |
| (ඇ) මුළු පිරිවැය රු.මිලියන 313.94 කට 2018 වර්ෂයේ සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල නව කොන්ත්‍රාත් 07ක් පිරිනමා තිබුණ ද ඒවායෙහි භෞතික ප්‍රගතියක් විගණනයට වාර්තා නොවිණි. ඒ අතරින්, මන්නාරම බෙදා හැරීමේ පද්ධතියට පයිප්ප සැපයීම හා එළීමේ කොන්ත්‍රාත්තුව, 2019 | අතිරේක පිරිවැයක් දැරීමට සිදු විය හැක. | පාර්ලිමේන්තුවේ හා පළාත් සභාවේ සමාජිකයන්ගේ ඉල්ලීම මත මෙම අතිරේක පයිප්ප එළම් සිදු කරන ලදි. | ව්‍යාපෘති කාලය තුළ කාර්යය නිම කළ යුතුය. |

පෙබරවාරි වන විට නිම කිරීමට එකඟ වී 2018 නොවැම්බර් 27 දින පිරිනමා තිබුණු අතර එහිදී ව්‍යාපෘතියේ කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු බව නොසලකා හැර තිබුණි.

**3.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද පිරිවැය රු.මිලියන 1.2ක් වූ පරිගණක මුද්‍රණ යන්ත්‍ර ව්‍යාපෘතියේ කාර්ය ඉටු කිරීම සඳහා සම්බන්ධ නොවන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කැලණිය කාර්යාලයට ලබා දී තිබුණි. | යෝග්‍ය නොවන අර මුදල් වෙන් කිරීමකි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතියේ සත්‍ය අවශතාවයන් හඳුනා ගත යුතුය. |

**3.4 නිශ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| භූගත ජලාශ සහ පොම්ප කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගන්නා ලද පුත්තලමේ පවතින පිරිසිදු කිරීමේ පිරියතයට යාබදව පිහිටි අක්කර 03 ක ඉඩම අවුරුදු දෙකක සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | ඉඩම අවභාවිතා කිරීමට හැකියාවක් ඇත. | පවතින පිරිපහදු පිරියත ප්‍රතිස්ථානය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. | අත්පත් කර ගත් ඉඩම අර්ථවත් අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියා කළ යුතුය. |